UNIVERSITY OF CAMBRIDGE INTERNATIONAL EXAMINATIONS
General Certificate of Education Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2: Translation and Reading Comprehension

May/June 2005

**1 hour 30 minutes**

Additional Materials: Answer Booklet/Paper

**READ THESE INSTRUCTIONS FIRST**

If you have been given an Answer Booklet, follow the instructions on the front cover of the Booklet.
Write your Centre number, candidate number and name on all the work you hand in.
Write in dark blue or black pen on both sides of the paper.
Do not use staples, paper clips, highlighters, glue or correction fluid.

Answer **all** questions.
The number of marks is given in brackets [ ] at the end of each question or part question.
At the end of the examination, fasten all your work securely together.

This document consists of **4** printed pages and **4** blank pages.

TL 1222 S89061/3
© UCLES 2005
UNIVERSITY *of* CAMBRIDGE International Examinations

[Turn over

**BLANK PAGE**

## Section A: Translation

**1** Translate into **English**.

මිතුරෝ තිදෙනෙක් ගසක් යට වාඩි වී සිටියහ. උසම ළමයා මෙසේ කීවේය: "ඔය දෙන්නටම වඩා ඉක්මණින් මට අර බැම්ම උඩට නගින්න පුළුවන්." "අපි ඒක පිළිගන්නෙ නෑ," අනිත් දෙදෙනා කීහ. පුංචිම ළමයා මෙසේ කීවේය: "එහෙනං අපි තරග කරල බලමු." පාසැල් වාරයේ අන්තිම දිනයේ තරගය පැවැත්වීමට තීරණය කොට ඔව්හු ඒ බව අනිත් අයටත් කීවෝය. තරගය විනිශ්චය කිරීම සඳහා වැඩිමහලු ගෑනු ළමයෙකු තෝරා ගත්හ. බැම්ම මුදුනේ සිට කඹ තුනක් අදින ලදී. ගෑනු ළමයා තරගය ආරම්භ කිරීමට නලාව පිඹිනවාත් සමගම පිරිමි ළමයි තිදෙනා බැම්ම වෙතට දිව්වෝය. උසම ළමයා ඉක්මනින් ඉහළට ඇදී ගියත් නැවතත් බැම් මුලටම ලිස්සා වැටුණ අතර කොටම ළමයා නැංගේ බාගයක් දුර පමණි. මධ්‍යම තරමේ ළමයා බැම්ම මුදුනටම නැගගත් අතර සියලු දෙනාම ඔහුට ප්‍රීති ඝෝෂා පැවැත්වූහ.

[10]

**2** Translate into **Sinhala**.

Many years ago a man and his wife lived in a small village in Sri Lanka. They owned land surrounding the village and employed several workers to harvest their crops and look after the animals.

They had three sons and a daughter. All the children attended the village school and studied hard. The couple hoped that one of their children would take over the management of their estate.

Over time, however, the children decided one by one that the village offered them fewer choices on what to do afterwards than the big cities, and moved out of the village.

The couple were old and worried about what to do with the land they owned. After speaking to their children, they decided to share three quarters of the land amongst the labourers who had served them loyally for so many years.

In return, the workers continued to look after the remaining quarter of the estate for the couple and their children.

[20]

## Section B: Reading Comprehension

Read the following passage carefully and then answer in **Sinhala** the questions that follow.

අවබෝධය

### ශ්‍රී ලංකාවේ අලුත් අවුරුද්ද

ලෝකයේ වෙනත් බොහෝ රටවලට වඩා ශ්‍රී ලංකාවේ රජයේ නිවාඩු දවස් ගණන වැඩිය. මෙසේ වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ලෝකයේ ප්‍රධාන ආගම් හතරක්ම දිවයිනේ පැවතීම හා ඒ එක් එක් ආගමට විශේෂ වූ උත්සව තිබීමයි.
ශ්‍රී ලංකාවේ ලොකුම උත්සවවලින් එකක් නම්, අප්‍රේල් මාසයේ දී පවත්වනු ලබන අලුත් අවුරුද්දයි. අලුත් අවුරුද්ද ලබන්නේ මධ්‍යම රාත්‍රියේදීයයි ඔබට සිතෙන්නට පුලුවන. එහෙත් මේ අලුත් අවුරුද්ද ලබන වේලාව නම් තීරණය කරනු ලබන්නේ නක්ෂත්‍රකාරයින් විසිනි. පරණ අවුරුද්ද අවසන් වන වේලාව හා අලුත් අවුරුද්ද ලබන වේලාව අතර තුර කාලය ‘නොනගතය’ නමින් හැඳින්වේ. මේ කාලය තුළ වෙනත් කිසිම ආකාරයක වැඩක නොයෙදී හුදෙක් ආගමික කටයුතුවල පමණක් යෙදිය යුතුය.
නිවස පවිත්‍ර කිරීමෙන් හා තෙල් පහනක් දැල්වීමෙන් මේ ආගමික කටයුතු ආරම්භ වේ. ඉන්පසු කාන්තාවෝ එක් වී අලුත් අවුරුද්ද උදාවන බව අසල්වැසියන්ට දැන්වීමට මෙන් රබන් ගසන්නට පටන් ගනිති. ඉදින් මේ රබන් හඬ නොඇසුණත් හෙණ හඬ මෙන් ගිගුම් දෙන රතිඤ්ඤා හඬ ඔවුන්ට ඒ බව දැනුම් දෙනු ඇත.
සාම්ප්‍රදායික අලුත් අවුරුද්ද අස්වැන්න හා සම්බන්ධ චාරිත්‍රයකි. අලුත් සහල්වලින් කිරිබත් පිසිනු ලබන අතර ගස්වලින් පැහැබර පලතුරු නෙළාගනු ලැබේ. චාරිත්‍ර ගණනාවක් ඉටු කිරීමෙන් පසු, පවුල්වල සාමාජිකයින් එළිමහනේ එක් රැස්වීම හා ළමයින්ට නිදහසේ සෙල්ලම් කිරීමට ඉඩ දීමත් සමග නියම අවුරුදු ප්‍රීති උත්සව ආරම්භ වේ.
උත්සවය පටන් ගැනීමට ටික වේලාවකට පෙර මුළු රටේම වැඩ කටයුතු ඇණහිටී. දුම්රියස්ථාන හා මහාමාර්ග, සිය පවුල් සමග එක්වීම සඳහා ඉක්මනින් ගමන් කරන්නවුන්ගෙන් පිරීතිරී යයි. සියලු කඩ සාප්පු වසා දමනු ලබන හෙයින් අවුරුදු චාරිත්‍ර පටන් ගැනීමට ඔන්න මෙන්න කියා නම් ඉතාම සුලු දෙයක් පවා සොයා ගැනීම අපහසු වෙයි.
මේ කාලයේ දී ධනවත් ශ්‍රී ලාංකිකයෝ අධික ලෙස ගමන් සඳහා වියදම් කරමින් තම ගම්රටවල් කරා ගොස්, අවුරුද්ද දිග නිවාඩුවක් ගතකිරීම සඳහා අවස්ථාව කරගනිමින්, පෝලෝ, ගොල්ෆ්, ටෙනිස් හෝ මොටෝරිය තරග වැනි සුබෝපභෝගී විනෝදාංශවල යෙදෙති. පෙර-මෝසම් උණුසුම දරන්නට අකැමැති දකුණේ වැසියෝ වඩා සිසිල් කඳුකරයට පළායති.
දිවයිනේ ඇතැම් ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින්, නිවාඩු දින ගණන වැඩි බවට හා රජයේ නිවාඩු දවස් අවුරුද්දෙන් අවුරුද්දට වෙනස් වීමට ඇති ඉඩකඩ ගැන පැමිණිලි කරති. කෙසේ වෙතත් ජාතික අලුත් අවුරුදු උත්සවය, ශ්‍රී ලාංකික දෙමළ හා සිංහල දෙපක්ෂයටම වැදගත් නිවාඩු කාලයක් බවට පත්වී තිබීම නිසා පමණක්ම නොව, ලොව වෙනත් කිසිදු රටක මේ අලුත් අවුරුදු උත්සවය නොපැවැත්වෙන නිසා ද එය සුවිශේෂ ජාතික උත්සවයක් බවට පත් වී ඇත.

© UCLES 2005

Now answer the following questions in **Sinhala** using your own words as much as possible.

1 ලොව වෙනත් බොහෝ රටවලට වඩා ශ්‍රී ලංකාවේ රජයේ නිවාඩු දින ගණන වැඩි මන්ද? [1]

2 ශ්‍රී ලංකාවේ අලුත් අවුරුද්ද මධ්‍යම රාත්‍රි 12 ට ආරම්භ වේද? ඔබේ පිළිතුරට එක් හේතුවක් දක්වන්න. [2]

3 නොනගත කාලයේ ලක්ෂණ හතරක් පෙන්වන්න. [4]

4 අලුත් අවුරුදු උත්සවය සඳහා මිනිසුන් සූදානම් වන ආකාර 2 ක් සඳහන් කරන්න. [2]

5 අවුරුද්ද උදාවන බව අවට අය දැන ගන්නේ කෙසේ ද? ඔවුන් එය දැනගන්නා ක්‍රම 2 ක් නම් කරන්න. [2]

6 මෙ ලෙඛනයට අනුව, අලුත් අවුරුදු දා චාරිත්‍රානුකූලව අනුභව කරනු ලබන කෑම වර්ග 2 ක් නම් කරන්න. මේ ආහාර වර්ගවල වැදගත්කම කුමක් ද? [4]

7 අලුත් අවුරුදු කාලය, සංචාරකයින්ට ලංකාවට යාමට හොඳම කාලය නොවන බවට හේතු 2 ක් පෙන්වන්න. [2]

8 අලුත් අවුරුද්ද දිග නිවාඩුවක් ගතකිරීම සඳහා අවස්ථාව කරගන්නා අය ධනවත් පුද්ගයින් ලෙස කතුවරයා හඳුන්වන්නේ ඇයි? හේතු 2 ක් දෙන්න. [3]

9 අලුත් අවුරුදු සමයේදී සමහර අය කඳුකරය බලා යන්නේ ඇයි? [1]

10 ඔබ සිතන පරිදි සමහර ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයින් නිවාඩු දින රාශියක් තිබීම ගැන අසතුටු වන්නේ ඇයි? හේතු 2 ක් පෙන්වන්න. [2]

11 අලුත් අවුරුද්ද ශ්‍රී ලංකාවට හොඳ බව පෙන්වීම සඳහා ඔබට හේතු 2 ක් සිතිය හැකි ද? [2]

[Total: 25]

© UCLES 2005

**BLANK PAGE**

**BLANK PAGE**

**BLANK PAGE**

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

University of Cambridge International Examinations is part of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is itself a department of the University of Cambridge.